www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නිලධාරීහු ගෝලීය මූල්‍ය අර්බුදය පිළිබඳ හිස් සහතික සපයයි

## Sri Lankan officials offer empty reassurances over the global financial crisis

**කේ. රත්නායක විසිනි**
**2008 ඔක්තෝබර් 7**

සෙසු රටවල සිටින සිය සගයන් මෙන් ම, ශ්‍රී ලංකාවේ නායකයන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ද එක්සත් ජනපද මූල්‍ය අර්බුදයේ විභවීය බලපෑම අඩු තක්සේරු කිරීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී සිටිති. මුදල් හා ආරක්ෂාව පිළිබඳ මූලික ඇමති තනතුරු ද දරන ජනාධිපති මහින්ද රාජපක්ෂ ඇතුලු ආන්ඩුවේ ඇමතිවරු, අර්බුදය පිළිබඳ මුලුමනින් ම පාහේ නිශ්ශබ්දව ඉඳ ඇත. ඒ එය ආර්ථිකයට හෝ උද්ධමනය වාර්තාගත ඉහල අගයන්ට තල්ලු කර ඇති දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ඔවුන්ගේ වියදම් සහගත වර්ගවාදී යුද්ධයට බල නොපානු ඇතැයි යන බලාපොරොත්තුවෙන් බවට සැකයක් නැත.

සහතික ඉදිරිපත් කිරීමේ කර්තව්‍යය භාර වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල්ට ය. ගෝලීය කොටස් වෙළඳ පොලවල් කඩා වැටීමට පසු දින, එනම් සැප්තැම්බර් 30 දා ඔහු මාධ්‍යවලට මෙසේ පැවසී ය: "ගෝලීය මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකාවට ඉතා දරුනු ලෙස බලපෑමට ඇති ඉඩකඩ අඩුයි." ශ්‍රී ලංකාව අර්බුදයෙන් පහරකෑම වලකාලීමට උදව් වනු වස් බැංකු විසින් දෙනු ලබන නය සීමා කිරීමේ පිලිවෙත් ක්‍රියාවට දැමීමට මහ බැංකුව පියවර ගන්නා බව ඔහු පැවසී ය.

සංසන්දනාත්මකව ගත් කල, කොටස් මිල ගනන් මත ඇති කර තිබෙන ක්ෂනික බලපෑම කුඩා එකකි. කබ්රාල් කතා කරමින් සිටින අවස්ථාවේ, කොලඹ සමස්ත කොටස් මිල දර්ශකය (ඒඑස්පීඅයි) ඒකක 43කින් හෙවත් සියයට 2කට ආසන්න ප්‍රමානයකින් පහල වැටුනි. එහෙත්, එක්සත් ජනපද කොංග්‍රස් මන්ඩලය බුෂ් පාලනාධිකාරයේ එ.ජ. ඩොලර් බිලියන 700 ඇප දීමේ සැලසුම පලමුව ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ආසියාවේ හා ජාත්‍යන්තරව වඩා විශාල ආර්ථිකයන්හි සෙසු වෙළඳ පොලවල් මුහුන පෑ කඩාවැටීම් බොහොමයකට වඩා මෙය තවමත් කුඩා අගයකි.

විවිධ ආර්ථික අටුවාකරුවන් නිරීක්ෂනය කර ඇති පරිදි, ශ්‍රී ලංකා ආර්ථිකයේ සීමිත ස්වභාවය, අඩු ගනනේ ආරම්භක අවස්ථාවේ දී, එහි වාසියට වැඩ කරනවා විය හැකි ය. හිටපු ආර්ථික විද්‍යා මහාචාර්ය එන්. බාලක්‍රිෂ්නන් පකිස්ථානු වෙබ් අඩවියකට පැවසුවේ, ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳ පොල "සාපේක්ෂව කුඩා" බැවින් අර්බුදයේ "බලපෑම ද එලෙස" වන බවයි. "අපගේ ආර්ථිකය පවත්වා ගෙන යනු වස් විදේශ ආයෝජන මත අප විශාල වසයෙන් රදා නොපවතින බැවින්" ශ්‍රී ලංකාව දරුනු ලෙස බලපෑමට ලක්වීමට ඇති ඉඩකඩ "බෙහෙවින් සීමිත" බව විශ්‍රාමලත් බැංකු විධායක ආර්. නඩරාජා පැවසී ය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රමානය, ගෝලීය මූල්‍ය කුනාටුවලට හා ජාත්‍යන්තර ආර්ථික මන්දගාමීත්වයකට එරෙහි සහතිකයක් වන්නේ නැති තරම් ය. තථ්‍ය වසයෙන් ගත් කල, දිවයිනේ දේශපාලන අස්ථාවරත්වයේ හා දිග්ගැසුනු සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් වන ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනවල මද භාවය ම, එහි ආර්ථිකයේ දුර්වලත්වය හා බිඳෙනසුලු ස්වභාවය පෙන්නුම් කරන ලක්ෂනයකි. යන්තම් ඩොලර් බිලියන 30ක් වන රටේ වාර්ෂික දල දේශීය නිෂ්පාදිතය (දදේනි) බිඳවැටී ඇති සමහර එක්සත් ජනපද හා යුරෝපීය බැංකුවලට වඩා කුඩා වන අතර පසුගිය සතියේ දී එක්සත් ජනපද කොංග්‍රස් මන්ඩලය විසින් බලාත්මක කරන ලද ඇප දීමේ සැලසුමෙන් විස්සෙන් පංගුවකටත් වඩා අඩු ය.

කබ්රාල් ප්‍රසිද්ධ සහතික ඉදිරිපත් කරද්දී පවා, ඔක්තෝබර් 2 දා සිට ආරම්භ වන පරිදි මසකට හය වතාවක්, සියයට 12ක අනුපාතිකයකින්, එක් දින නැවත ප්‍රතිවිකුනුම් පහසුකමක් ශ්‍රී ලංකාවේ බැංකුවලට ප්‍රදානය කිරීමට මහ බැංකුව, සූදානම් වෙමින් සිටියේ ය. මීට පෙර මෙම පහසුකම ලබා දී තිබුනේ මසකට තුන් වතාවක් පමනි. සියයට 12 අනුපාතිකයකින් ආන්ඩුවේ බැඳුම්කර නැවත මිලදී ගැනීම මගින් බැංකු පද්ධතියට රුපියල් බිලියන 7.5ක් (ඩොලර් මිලියන 69) එකතු කිරීමට තමන් සූදානම් බව ද මහ බැංකුව නිවේදනය කලේ ය.

පැහැදිලිව ම මෙම පියවර ගෙන ඇත්තේ, ගෝලීය නය මිරිකීමක හා අන්තර්-බැංකු නය දීම මත පවත්නා බරපතල සීමාවන්ගේ කොන්දේසි යටතේ බැංකු පද්ධතියට මුක්කු ගැසීමට ය. කොලඹ සෙලින්කෝ ශ්‍රීරාම් සෙකියුරිටීස් සමාගමේ ප්‍රධාන කලමනාකාර

සංජීව දයාරත්න *Bloomberg.com* වෙබ් අඩවියට කියා සිටියේ, මහ බැංකුවේ තීන්දු එක් දින මූල්‍ය වෙළඳ පොලේ තදබදය ලිහිල් කොට,” ආන්ඩුවේ සුරැකුම්පත් කලබලයට පත්ව විකුනා දැමීම අඩු කිරීමට ඉඩ ඇති ” බව යි.

මූල්‍ය ආයතන හිමිකරුවකු වූ සක්විති රනසිංහ සම්බන්ධ සෝලියක් මූල්‍ය පද්ධතිය ඇතුලත පවත්නා ආතතීන් අවධාරනය කිරීමට උදව් වී තිබේ. සක්විති ඉතා ඉහල පොලී අනුපාතික ලබා දෙන බවට පොරොන්දු වෙමින් සිය නිවාස සමාගමට ආයෝජකයන්ගේ අරමුදල් රුපියල් බිලියනයකට ආසන්න ප්‍රමානයක් ලබා ගත්තේ ය. ඔහුගේ සමාගම මූල්‍ය ආයතනයක් ලෙස මහ බැංකුවේ ලියාපදිංචි කර නැත. පොලීසිය මීට වසර දෙකකට ඉහත දී සමාගමේ මූල්‍ය අක්‍රමිකතා පිලිබඳව වාර්තා කර තිබුනත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේ නැත.

රටෙන් පලා ගොස් සිටින සක්විති දැන් විවෘත මූල්‍ය වංචාකරුවකු ලෙස පෙන්නුම් කෙරෙයි. එහෙත් ආයෝජකයන් ඉහල පොලී අනුපාතික ලබා ගැනීමට මංමුලා සහගතව සිටින බැවින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තත්වය අතිශයින් සමපේක්ෂක හෝ විවෘතව ම නීති විරෝධී මූල්‍ය ක්‍රියාකාරකම්වලට දිරි දෙයි. රටේ උද්ධමනය වේගය දැන් සියයට 30 ආසන්නයේ පවතී. එය සියයට 18 සිට 20 දක්වා වන සාමාන්‍ය පොලී අනුපාතිකයය වඩා බෙහෙවින් ඉහල අගයකි. සියයට 84 තරම් ඉහල පොලී අනුපාතික පොරොන්දු වන තවත් “කූට ආයතන” පවතින බවත් එවන් පොලී අනුපාතික” වත්මන් සන්දර්භය තුල කොහෙත් ම සහතික කල නොහැකි” බවත් මහ බැංකුවේ අධිපති කබ්රාල් පසුගිය සතියේ අනතුරු ඇඟවී ය.

නය මිරිකීමක බලපෑම සැක කටයුතු මූල්‍ය සමාගම්වලට පමනක් සීමා නොවනු ඇත. පසුගිය වසර දෙක තිස්සේ රාජපක්ෂ ආන්ඩුව ආරක්ෂක වියදම් යලි යලිත් ඉහල දමා ඇත -- 2008 සඳහා සියයට 20කිනි. සිය යුද්ධය සඳහා ගෙවනු වස්, ආරක්ෂක නය වසයෙන් රුපියල් මිලියන 181,449ක් නයට ගනිමින්, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳ පොල දෙසට හැරීමට ආන්ඩුවට යලි යලිත් සිදු වී තිබේ. ඉක්මනින් ම එම අරමුදල් මූලාශ්‍රය ද වියලී යනු ඇත.

පසුගිය සතියේ නිකුත් කල වාර්තාවක, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් නම් ජාත්‍යන්තර ශ්‍රේනිගත කිරීමේ ඒජන්සිය, මතුවෙමින් පවතින වෙළඳ පොලවල් සඳහා පවත්නා බලාපොරොත්තු හීන වන බවට අනතුරු අඟවා, ශ්‍රී ලංකාව ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, හංගේරියාව, කසකස්ථානය, පකිස්ථානය, සර්බියාව හා වියට්නාමය සමග “නිෂේධනීය දෘෂ්ටියක් ” සහිත රටවල් අතෙන් එකක් ලෙස ලැයිස්තුගත කලේ ය. එක්සත් ජනපදයේ හා යුරෝපයේ අපනයන වෙලඳ පොලවල ඇති වන කිසියම් පහල බැස්මකට ශ්‍රී ලංකාව වැනි රටවල් ගොදුරුවීමේ හැකියාව එය විශේෂයෙන් ම පෙන්වා දුන්නේ ය.

පසුගිය සතියේ කල අදහස් දැක්වීමේ දී, කබ්රාල් සර්වශුභවාදී ලෙස කියාපෑවේ “එක්සත් ජනපදය මන්දාවධමනයකට ගියා වුවත්” ශ්‍රී ලංකාවේ ඇගලුම් අංශයට එමගින් ඇති වනු ඇත්තේ “අඩු බලපෑමක්” බව යි. කෙසේ වෙතත්, *2007 මහ බැංකුවේ වාර්ෂික වාර්තාවට* අනුව, 2007 දී ශ්‍රී ලංකාවේ රෙදිපිලි හා ඇගලුම් අපනයනවලින් සියයට 50කට ආසන්න ප්‍රමානයක් ගියේ එක්සත් ජනපදයට වූ අතර තවත් සියයට 45ක් යුරෝපා සංගමයට ගියේ ය. මෙම අංශය, සමස්ත අගයෙන් සියයට 43කට වග කියමින්, රටේ විශාලතම විදේශ විනිමය උපයන මූලාශ්‍රය වේ.

වත්මන් ජාත්‍යන්තර මූල්‍ය කුනාටුව දිවයිනට බල නොපානු ඇතැයි ශ්‍රී ලංකාවේ පුවත්පත් සිය පාඨකයන්ට හිස් සහතික වීම් සපයයි. නිදසුනක් ලෙස, පසුගිය සතියේ *ඩේලි මිරර්* පත්‍රයේ පල වූ කතුවැකියක්, අර්බුදයේ” මූල හේතුව ඇමරිකානු ශෛලියේ ධනවාදය යි” යන යුරෝපීය විවේචන ප්‍රතිරාවය කලේ ය. කෙසේ වෙතත්, සති අන්තයේ දී, යුරෝපීය බැංකු හා ආයතන මාලාවක් ම පවරා ගැනීමට හෝ ඇප දී ගලවා ගැනීමට සිදු වූයේ, යුරෝපීය ධනවාදය ද එහි ඇමරිකානු සගයා මෙන් ම අර්බුදයට ගොදුරු වීමේ හැකියාවෙන් යුක්ත බව පැහැදිලි කරමිනි.

ආන්ඩුවේ හොරනෑව ලෙස ක්‍රියා කරන, රාජ්‍ය-සතු *ඩේලි නිව්ස්* පත්‍රය පසුගිය සිකුරාදා පල කල කතුවැකියක්, එක්සත් ජනපදයේ “තාවකාලික ඇප දීමක් මගින් අඩු ගනනේ මේ අවස්ථාවට වත් නරකම තත්වය පිලිබඳ භීතිකාවන් සමනය කර ඇති බවක් පෙනී යන” බව ප්‍රකාශ කලේ ය. “ලෝකයේ මූල්‍ය සුපිරි බලවතාගේ හදිසි වෙනස්වීම් හමුවේ ගෝලීය ආර්ථිකයේ පවත්නා අනාරක්ෂිත භාවය” අර්බුදය මගින් පෙන්නුම් කෙරෙන බව ද සඳහන් කිරීමෙන් පසුව, ලේඛකයා” ගුරුත්ව කේන්ද්‍රයෙන් බොහෝ දුරින් පිහිටීම මගින් ශ්‍රී ලංකාව වැනි රටකට මූල්‍ය කලබගැනියේ ක්ෂනික වේදනාව නොදැනීමට ඉඩ ඇත” යන බලාපොරොත්තුව ඉදිරිපත් කලේ ය.

කතුවැකිය, මොන යම් හෝ ආර්ථික හදිසි තත්වයක් සමග පොර බැදීමට යොදා ගනු ඇති පිලිවෙත් සම්බන්ධයෙන් කිසිදු සැකයකට ඉඩ නොතබා ඇත්තේ, මෙසේ ප්‍රකාශ කරමිනි: “වත්මන් අර්බුදය ආර්ථික ප්‍රවේශම් සහගත භාවයේ අවශ්‍යතාව යලිදු වරක් අතිශය බලගතු ලෙස අවධාරනය කරයි.” මෙම කැඳවුම වනාහි, රාජ්‍ය අංශයේ වැටුප්, කොන්දේසි හා රැකියා ද සමාජ සේවාවන් හා ගොවීන්ට ලබා දෙන සහනාධාර

ද තව දුරටත් ගැඹුරින් ම කපා දැමිය යුතු ය යන්න නොවැලැක්විය හැකි ලෙස ම අදහස් කරන ආන්ඩුවේ වියදම් කප්පාදුවක් සඳහා නව ම්ලේච්ඡ පිලිවෙත් අවශ්‍ය බවට කෙරෙන තුනී ලෙස ආවරනිත ඉල්ලීමකි.

ආන්ඩුව කම්කරුවන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන් හා දුගීන්ගෙන් එල්ල වන ඕනෑම විරුද්ධත්වයක් සතුරාට -- "කොටි ත්‍රස්තවාදීන්ට" -- ආධාර කිරීමක් ලෙස හංවඩු ගසන තතු යටතේ, මෙම පටි තද කර ගැනීමේ පිලිවෙත් ක්‍රියාවට දැමෙනු ඇත්තේ, යුද-ගැති වාර්ගික උන්මාදය උත්සන්න කිරීමක් ද මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් තව දුරටත් කප්පාදු කිරීමක් ද සමග ය. ගෝලීය මූල්‍ය කලබැගෑනිවල "බලපෑමට හසු නොවනවා" නොව, එමගින් ශ්‍රී ලංකාව, දැනටමත් මුහුන දී සිටින බරපතල දේශපාලන, ආර්ථික හා සමාජ අර්බුදය තව දුරටත් ගැඹුරු වීමට ඉඩ ඇත.

© www.wsws.org